# මාධ්‍ය නිවේදනය

හඳුනා නොගත් වෛරසයක් මගින් වැළඳෙන නියුමෝනියා රෝගයක් පිළිබඳව චීනයේ හුබෙයි ප්‍රාන්තයේ වුහාන් නගරයෙන් මුල් වරට 2019 දෙසැම්බර් මස 31 දින ලෝක සෞඛ්‍ය සංවිධානයට වාර්තා විය. ඉන් සතියකට පසු එනම් 2020 ජනවාරි මස 07 දින මෙය කොරෝනා වෛරස කාණ්ඩයට අයත් නව වෛරස ප්‍රභේදයක් ලෙස තහවුරු කළ අතර එය “2019-nCoV” (නව කොරෝනා වෛරසය) ලෙස නම් කරන ලදී. කොරෝනා වෛරස යනු වෛරස වර්ග ගණනාවක් අයත් කාණ්ඩයක් වන අතර එය සතුන් සහ මිනිසුන් අතර පැතිරීමේ හැකියාව පවතී. ඒ මගින් සාමාන්‍ය සෙම්ප්‍රතිශ්‍යාවේ සිට මැද පෙරදිග ස්වසන සහලක්ෂණය (Middle East Respiratory Syndrome) සහ සාර්ස් වැනි උග්‍ර රෝගී තත්ත්වයන් ඇති කළ හැකි ය.

නව කොරෝනා වෛරසය නිසා රෝගී වූවන් ප්‍රමාණයේ වැඩි වීමක් චීනයේ හුබෙයි ප්‍රාන්තයෙන් ද චීනයේ වෙනත් ප්‍රාන්ත සහ නගර ගණනාවකින් ද තවත් රටවල් කිහිපයකින් ද වාර්තා වී ඇත. 2020 ජනවාරි 25 දින වන විට නව කොරෝනා වෛරසය නිසා රෝගී වූවන් 1,370 ක් වාර්තා වී තිබූ අතර ඉන් 1,297 දෙනෙකු චීනයෙන් (තායිපේ, මැකාවු සහ හොංකොං ප්‍රදේශ ඇතුළුව) වාර්තා වී ඇත. අනෙක් රටවලින් වාර්තා වූ 23 දෙනෙකු අතරින් 21 දෙනෙකු ම වුහාන් නගරයේ සිට පැමිණි අය වේ. මෙම රෝගීන් අතර මරණ 41 ක් වාර්තා වී ඇති අතර ඒ සියල්ල ම චීනයෙනි.

මේ අතර වුහාන් නගරයේ සිට පැමිණි ශ්‍රී ලාංකිකයෙකු 2020 ජනවාරි මස 24 දින ද ඒම නගරයෙන් ම පැමිණි චීන ජාතික සංචාරයින් දෙදෙනෙකු ජනවාරි මස 25 දින ද ස්වසන රෝග ලක්ෂණ සහිතව අංගොඩ ජාතික බෝවන රෝග ආයතනයට (Institute of Infectious Diseases) ඇතුළු කර පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී. මේ තිදෙනා ම කාන්තාවන් වන අතර ඔවුන් රෝහලට ඇතුළු කරන විටත් සුළු රෝග තත්ත්වයෙන් පසු වූවන් වන අතර ගේ ඔවුන් ගේ වර්තමාන සෞඛ්‍ය තත්ත්වය අවදානමින් තොර බව තහවුරු කළ හැකි ය. මේ තිදෙනා ට නව කොරෝනා වෛරස ආසාදනය පවතීදැයි අවශ්‍ය පරීක්ෂණ මේ වන විට සිදු කරමින් පවතින අතර ඉදිරි දින දෙක තුළ අවසන් පරීක්ෂණ ප්‍රතිඵල දැන ගත හැකි වනු ඇත.

නව කොරෝනා වෛරසය එක් පුද්ගලයෙකුගෙන් තවත් අයකුට පැතිරීමේ හැකියාව ඇත. චීනයෙන් වෙනත් රටවලට පැතිරුණු ආකාරයට ම මෙම රෝගය ලංකාවට ද පැතිරීමේ අවදානමක් ඇති බැවින් ශ්‍රී ලංකාවට ඇතුළු වන තොටුපල වල ඒ සඳහා අවශ්‍ය පෙර සූදානම ක්‍රියාත්මක කර ඇත. ඒ අතර:

- ලංකාවට පැමිණෙන ගුවන් මගීන් මෙම රෝගය පිළිබඳ ව ගුවනේ දීම දැනුවත් කරන අතර යමකුට මෙම රෝග ලක්ෂණ එනම් අධික උණ, කැස්ස, සෙම් ප්‍රතිශ්‍යාව සහ හුස්ම ගැනීමේ අපහසුතාව තිබේ නම්, ගුවන් තොටුපලේ සෞඛ්‍ය අංශයට වාර්තා කරන ලෙසට උපදෙස් ලබා දෙනු ලැබේ.
- ගුවන් තොටුපලේ සෞඛ්‍ය අංශය දවසේ පැය 24 පුරා ම ක්‍රියාත්මක වේ
- ලංකාවට පැමිණෙන මගීන් අතර උණ සහිත රෝගීන් සිටී දැයි නිරීක්ෂණය කිරීම සඳහා ස්කෑනර් යන්ත්‍ර (thermal scanners) ස්ථාපනය කර ඇත.
- ස්වසන රෝග ලක්ෂණ සහිත මගියෙකු ගුවන් තොටුපල සෞඛ්‍ය අංශයට වාර්තා වුව හොත් ඔවුන්ට නව කොරෝනා වෛරස රෝගය තිබේ දැයි සැක කළ හැකි ද යන්න පරීක්ෂා කරනු ඇත.
- එවැනි අවදානමක් තිබේ නම් ඔවුන් රෝහල් ගත කර අවශ්‍ය පරීක්ෂණ සහ ප්‍රතිකාර ලබා දීම සිදු කරනු ඇත.

සියලු ජනතාව ස්වසන ආසාදන පාලනය සහ වළක්වා ගැනීම සඳහා ගත යුතු සාමාන්‍ය ක්‍රියා මාර්ග අනුගමනය කිරීම සුදුසු ය. ඒවා නම්:

- ජනාකීර්ණ තැන්වල ගැවසීමෙන් වළකින්න.
- අත් නිතර සබන් යොදා සේදීම හෝ ඇල්කොහොල් සහිත පිරිසිදු කාරක (alcohol based hand rubs) යොදා පිරිසිදු කරන්න.
- කහින විට හෝ කිවිසුම් යන විට අතේ වැළමිට ප්‍රදේශය පාවිච්චි කර මුඛය සහ නාසය ආවරණය කර ගන්න. නැතිනම් ටිෂූ පාවිච්චි කර ඒවා ආරක්ෂිත ව අපරහණය කරන්න.
- උණ සහ කැස්ස සහිත අය සමීපව ආශ්‍රය කිරීමෙන් වළකින්න.
- ඔබ නව කොරෝනා වෛරස් රෝගය සහිත පළාතක සිට පැමිණි පසු උණ සහ කැස්ස වැළදේ නම් වහාම වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු වන්න. ඔබ ගේ ගමන් විස්තර වෛද්‍යවරයා සමග පවසන්න.




**වෛද්‍ය සුදත් සමරවීර**

**ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥ**

**වසංගත රෝග විද්‍යා අංශය**

**සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය**


**2020 ජනවාරි 26**